බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.

மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.

**Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and Information Technology - Western Province**

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
2 ஆம் மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம், 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


මගේ අංකය / எனது இலக்கம் / My Ref. } 5/1/කෙටි නාට්‍ය -2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. }
දිනය / திகதி / Date } 2024.06. 24

ප්‍රාදේශීය ලේකම් මඟින්,
සංස්කෘතික නිලධාරී/සංවර්ධන නිලධාරී(සංස්කෘතික),

.....................................

**<u>බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව සහ තරඟාවලිය - 2024</u>**

ආධුනික නාට්‍යකරුවන්ගේ කුසලතා සංවර්ධනයට විධිමත් සහ නිවැරදි අවස්ථාවක් සලසාදීම තුළින් කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීමේ අරමුණින් මෙම අමාත්‍යාංශය මඟින් මෙම වර්ෂයේදීද කෙටි නාට්‍ය වැඩමුළුවක් සහ තරඟාවලියක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

02. කෙටි නාට්‍ය පිටපත් ලිවීමේ සිට වේදිකා ගත කිරීම දක්වා සියළුම අවස්ථා ඇතුලත්ව නාට්‍ය නිෂ්පාදනයට අදාල අත්දැකීම් නේවාසික වැඩමුළුවක් මඟින් ලබාදී අවසානයේ කෙටි නාට්‍ය තරඟාවලියක් පවත්වා සම්මාන ප්‍රදානය සිදු කිරීම හා නාට්‍යකරුවන් සමාජගත කිරීම මෙම වැඩසටහනේ අරමුණ වන අතර, නාට්‍ය පිටපත් රචනය, රංගනය, සංගීතය, වේදිකා පසුතල නිර්මාණය, රංගවස්ත්‍ර නිර්මාණය, රංගාලෝකකරණය, අධ්‍යක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන් මෙහිදී ආවරණය කෙරේ.

03. ඒ අනුව වයස අවුරුදු 16-30 අතර බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවන්හට මේ සඳහා සහභාගී විය හැකි අතර, මේ පිළිබඳව අදාල සමිති හා කලායතන දැනුවත් කර මේ සමඟ අමුණා ඇති අයදුම්පත සම්පූර්ණ කර 2024.07.25 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස අදාල පාර්ශව දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

ඒ.ඩී.එස්. සදීකා

ලේකම්

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

බස්නාහිර පළාත

දුරකතන අංක :- 0112092873
ෆැක්ස් :- 0112092874
ඊ - මේල් ලිපිනය :- <u>minculturalwp@gmail.com</u>


| | කාර්යාලය / அலுவலகம் / Office | ලේකම් / செயலாளர் / Secretary | ගිණුම් / கணக்குகள் / Accounts | සැලසුම් / திட்டமிடல் / Planning | ක්‍රීඩා / விளையாட்டு / Sports | සංස්කෘතික / கலாசார / Cultural |
|---|---|---|---|---|---|---|
| දුරකතන / தொலைபேசி /Phone | 0112 092883<br>0112 093075 | 0112 092873 | 0112 093088<br>0112 093068 | 0112 092869<br>0112 093135 | 0112 092887<br>0112 093097 | 0112 092875<br>0112 093105 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 0112 092874 | 0112 092874 | 0112 092880 | 0112 092874 | 0112 092888 | 0112 092874 |
| ඊ මේල් / E-mail / | moe.wp.gov@gmail.com | | වෙබ් ලිපිනය/இணையதளம்/WebSite | | www.moe.wp.gov.lk | |

**බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව සහ තරඟාවලිය - 2024**

**බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**උපදෙස් සහ තොරතුරු**

1. මෙම වැඩමුළුව, නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණ ශිල්පීන්ගේ සම්පත්දායකත්වයෙන් පිටපත් රචනය, රංගනය, වේෂ නිරූපනය, රංග වස්ත්‍ර නිර්මාණය, පසුතල නිර්මාණය, නාට්‍ය සංගීතය ඇතුළු නාට්‍යයක අනුෂාංගික අංග පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ලබාදීම මෙන්ම, තරුණ නාට්‍යකරුවන් හඳුන්වාදීම, කෙටි නාට්‍ය කලාව පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීම, නාට්‍ය නැරඹීමේ ප්‍රශස්ථ සංස්කෘතියක් ගොඩනංවා ගැනීම යන අරමුණු පෙරදැරිව බස්නාහිර පළාතෙහි තෝරාගත් ස්ථානයක දින 05ක නේවාසිකව වැඩමුළුවක් ලෙස පැවැත්වේ.(මෙම වැඩසටහන සඳහා කිසිඳු අය කිරීමක් නොමැති අතර ආහාර-පාන, නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.)
2. ඉහත වැඩමුවළුව අවසානයෙහි ඒ සඳහා සහභාගීවූවන්ගෙන් කෙටි නාට්‍ය තරඟාවලිය සඳහා නාට්‍ය පිටපත් කැඳවන අතර, ඒ අතරින් තෝරා ගන්නා ලද හොඳම කෙටි නාට්‍ය පිටපත් 10 නිෂ්පාදනය සහ නාට්‍ය තරඟාවලියෙහි පළමු වටය සඳහා සුදුසුකම් ලබයි.
3. නිෂ්පාදනය සඳහා සුදුසුකම් ලැබූ නාට්‍ය සහ එම කණ්ඩායම්, සඳහා ප්‍රවීන සම්පත්දායකයින්ගේ සහභාගීත්වයෙන් නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ දෙදින වැඩමුළුවක් පවත්වනු ලබයි.
4. පළමු වටය සඳහා ඉදිරිපත් කරන ලද නාට්‍ය අතරින් අවසන් වටය සඳහා නාට්‍ය නිෂ්පාදන 05ක් තෝරාගනු ලබයි. අවසාන වටයේදී එම නාට්‍ය තුලින් බස්නාහිර පළාත් කෙටි නාට්‍ය තරඟාවලියෙහි ජයග්‍රාහක නාට්‍ය සහ සම්මාන සඳහා සුදුසුකම්ලාභීන් තෝරා ගනු ලබයි.
5. 2024 වර්ෂ අවසානයෙහි බස්නාහිර පළාත් කෙටි නාට්‍ය උලෙළ පවත්වනු ලබන අතර, එහිදී ජයග්‍රාහී නාට්‍යයන් සඳහා සම්මාන හා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීමට අපේක්ෂිතය.
6. වැඩමුළුව සඳහා සහභාගී වීමට අපේක්ෂිත අයදුම්කරුවන් වයස අවුරුදු 16-30 අතර, බස්නාහිර පළාතේ පදිංචිකරුවන් විය යුතු අතර, 2024.07.25 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණවද අවුරුදු 30 නොඉක්මවිය ද යුතුය.
7. මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පාසල් අයදුම්කරුවන් විදුහල්පති මගින්ද, සෙසු අයදුම්කරුවන් ග්‍රාම නිලධාරි මගින්ද සහතික කර තිබිය යුතුය.
8. වැඩමුළුව සඳහා සහභාගීවන්නන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගන්නා අතර සෑම අයදුම්කරුවෙකුම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත/ තැපැල් හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය හා සුදුසුකම් සනාථ කිරීම සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය.
9. මෙම වැඩමුළුව හා සම්බන්ධව බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් ගනු ලබන නීති-රීති සහ තීරණවලට අයදුම්කරුවන් එකඟ විය යුතුය.
10. අයදුම්පත යොමු කිරීමේදී අයදුම්පත බහාලන කවරය වම්පස ඉහළ කෙලවර **"බස්නාහිර පළාත් කෙටිනාට්‍ය වැඩමුළුව හා තරඟාවලිය - 2024"** යනුවෙන් සඳහන් කළ යුතුය.
11. ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.07.25 දිනට පෙර ඔබ පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරි වෙත හෝ **ලේකම්, බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,2වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය ,204,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට යොමු කර යුතුය.
12. වැඩිදුර විස්තර පහත නිලධාරීන්ගෙන් ලබා ගත හැක.

| | |
|---|---|
| තිසරු කෝට්ටගේ මෙය (සංස්කෘතික නිලධාරි) | - 0716332797 |
| එල්.පී. හිමාෂා සඳමාලි මිය (සංස්කෘතික නිලධාරි) | - 0740188461 |
| ඩී.ඒ. ඉෂාන්ත දීපාල් මයා (සංස්කෘතික නිලධාරි) | - 0701364574 |
| දිලිප අළුත්වත්ත මයා (සංස්කෘතික නිලධාරි) | - 0719019675 |
| එම්.ඩී.ඒ.ඩබ්ලිව් ඉයුනිල් මිය (සංස්කෘතික නිලධාරි) | - 0766255018 |

## අයදුම් පත්‍රය

**බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව සහ තරඟාවලිය - 2024**

**බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

1. සම්පූර්ණ නම - ..........................................................................................
2. මුලකුරු සමග නම - ..........................................................................................
3. උපන් දිනය - ........................... 2024.07.25 දිනට වයස .................................
4. ජා.හැ.අංකය - ..........................................................................................
5. ස්ථිර ලිපිනය - ..........................................................................................
6. දුරකථන අංකය - ස්ථිර........................ ජංගම.......................... වට්ස්ඇප්.................
7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ..........................................................................................
8. දිස්ත්‍රික්කය - ..........................................................................................
9. I.ඔබ නාට්‍ය හා රංග කලාව විෂයක් ලෙස හදාරන්නේද? /ක්ෂේත්‍රයෙහි නිරත වන්නේද? ......................................

   II.ඉහත 9.Iට අදාල විස්තර - ..........................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන නාට්‍ය වැඩමුළුව සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂා කරන මා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් කරුණු සත්‍ය බවත්, නාට්‍ය වැඩමුළුවේදී බස්නාහිර පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ නීති, රෙගුලාසි හා තීරණවලට එකඟවන බවත්, මින් ප්‍රකාශ කරමි.

..............................                                        ...................................

දිනය                                                                  අයදුම්කරුගේ අත්සන

---

**තොරතුරු තහවුරු කිරීම**

................................................................. යන අයදුම්කරු විසින් ලබා දී ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

..................................

විදුහල්පති/ග්‍රාම නිලධාරි
අත්සන හා නිල මුද්‍රාව

- පාසල් අයදුම්කරුවන් විදුහල්පති විසින් සහතික කල යුතුය.